# නාථ සංකල්පයේ ඓතිහාසික පසුබිම සහ මහනුවර යුගයේ නාථ දෙවියන් ප්‍රමුඛවීම

අජිත් තල්වත්ත

බෞද්ධ ජන සමාජයෙහි නිබඳ ව ගෞරවාදරයට ලක්වන දෙවියකු ලෙස නාථ දෙවියන් සැලකිය හැකිය. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයට අනුව, නිර්වාණය මගින් සසර ගමන කෙළවර වී අවසාන විමුක්තිය ලද හැකි වුවත්, දෙවියන් සරණ යෑම එතරම් ම දුරට පිළිගන්නේ නැති බවක් පෙනේ. එනමුත් කාලානුරූප ව සිදු වූ වෙනස්වීම් තුළ බෞද්ධ චරියාවන් තුළ දෙවියන් සම්බන්ධ ක්‍රියා පිළිවෙත් සම්මිශ්‍ර වී ඇත. බෞද්ධ සංකල්පය හා දේව සංකල්පය එකිනෙකට බද්ධ වීම පොළොන්නරු යුගයෙන් පසු සෘජු වශයෙන් සිදුවිය. එලෙස මුසු වී ජනතා ගෞරවාදරයට පත් දෙවි කෙනකු ලෙස නාථ දෙවියන් සැලකිය හැකිය.[1] මෙරට ඉතිහාසයේ නාථ දෙවියන් වඩාත්, වැදගත් වන්නේ බෝධිසත්ව තත්ත්වයේ සිට ක්‍රමික ව දේවත්වයට පත්වීම නිසාය. මුල දී අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ලෙස පුද පූජා ලැබූ මෙම දෙවියන් පසුකාලීනව බෝධිත්ව තත්ත්වයෙන් මිදී දේවත්වය ආරෝපණය කරගන්නා ආකාරය දක්නට ලැබේ.[2] එලෙස නාථ දෙවියන් බවට පත්වීමට උප්පත්තිය කෙබඳු ලෙසින් සිදු වූවාද යන්න හඳුනාගැනීම ඉතා වැදගත් වේ.

පොළොන්නරු යුගයෙන් පසුව එනම් 14 වන සියවස සිංහල ඉතිහාසයේ දේශපාලන හා ආර්ථිකයේ පසුගාමී යුගයකි.[3] පුලස්තිපුරය දහතුන් වන සියවස අග භාගයේ දී අතහැර දමා ආරක්ෂා උපායක් වශයෙන් නිරිතදිගට සංක්‍රමණය වීම ඇරඹුණි. නමුත් අනුරාධපුර යුගයේ සිට ම ජනප්‍රිය ව පැවති මහායාන බෝධිසත්ව සංකල්පය 14 වන සියවස වන තෙක්ම සිංහල සමාජ, දේශපාලන ව්‍යුහයක් තුළට සුවිශේෂී වූ බව නොපෙනේ. මෙම බෝධිසත්වයන් දේශීය බවට පත්වීම සිදුව ඇත්තේ ගම්පොළ

යුගයේ දී වන අතර එතැන් සිට අවලෝකිතේශ්වර ස්වීයත්වය හා අනන්‍යතාව ද සැකසීමට භාජනය විය.[4] අවලෝකිතේශ්වර නාථ නමින් ආරම්භ වී ඇත්තේ 14 වන සියවසේ ගම්පොළ යුගයේ දී බවට සාධක ඇත. ඔහුගේ තවත් අභිදානයක් වන "ලෝකේශ්වර නාථ" යන්නෙහි කෙටි නම වන නාථ යන නමිනි. මෙම හැඳින්වීම නිසා බෝධිසත්වයන්ගේ අතීතය මුළුමනින් ම මැකී ගිය ද උඩරට රාජධානියේ දේශපාලන උරුමය තහවුරුවට සම්බන්ධ වී ලෞකික දෙවියකු බවට පත් විය.

පොළොන්නරු යුගයෙන් පසු මෙරට ඇති වූ දේශපාලන සහ සාමාජික අස්ථාවරත්වය හේතු කොට ගෙන දේව ඇදහීම කෙරෙහි ජනතාව වඩාත් නැඹුරු වූ බව පෙනේ. තව ද ශ්‍රී ලාංකේය දේශපාලන බලය සුන්බුන් වීමට අමතර ව සිදු වූ තවත් සුවිශේෂී දෙයක් වන්නේ සෑම ස්තරයකට ම බලපාන අයුරින් පෙර නොපැවති තරම් සංස්කෘතික අනුකලනයක් ඇති වීමයි. මේ සමඟ ම හින්දු හා මහායානික සංකල්ප රාශියක් සම්මිශ්‍රණය වීම සිදු විය. එසේ ම මහායාන අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ශ්‍රී ලාංකීය දෙවි කෙනෙකු වශයෙන් සලකා නාථ දෙවියන් බවට පරිවර්තනය වීමත් සිදු වේ. 15 වන සියවස වන විට නාථ දෙවිඳුන් ඇඳහීම ශ්‍රී ලංකාවේ ඉතා සුලභ දෙයක් වී ඇත.[5] සමස්තයක් වශයෙන් බැලිමේ දී ගම්පොළ යුගය දේශපාලන වශයෙන් යම් අවස්ථාවරත්වයක් නිරූපණය කළත් සංස්කෘතික වෙනස්වීම් හා හැඩගැසීම් බෙහෙවින් සිදු වූ යුගයක් වශයෙන් හඳුනාගත හැකිය. ගම්පොළ යුගයේ දී බෝධිසත්ව වන්දනය බෙහෙවින් ජනප්‍රිය ව පැවති බවක් දක්නට ලැබේ. මෙය එකවර ඇති වූවක් නොව ක්‍රමික ව විකාශනය වූවකි. දඹදෙණි යුගයේ දෙවන පැරකුම් රජු බුදු බව ප්‍රාර්ථනා කරවීමට දේවපතිරාජ අගමැතිවරයාගේ ආරාධනාවෙන් බුද්ධ පුත්‍ර හිමයෝ පූජාවලිය රචනා කළහ.[6] මෙම යුගයේ දී මහා දුර්භික්ෂයක් ඇති වූ විට රජවරුන් "තුනුරුවන්, චෛත්‍ය, බෝධීන්ට ද මහාර්ධි හැකි නාථ, මෛත්‍රෙය දේවාද පිදිය යුතු දෙවියන්ට පූජා පවත්වා[7]" වර්ෂාව ප්‍රාර්ථනා කර ඇත. මෙම රජතුමාගේ සහෝදරයා වූ විජයබාහු, බෝසත් විජයබාහු ලෙස හඳුන්වා තිබේ.

බෝධිසත්ව වන්දනය හා බුද්ධත්වය ප්‍රාර්ථනා කිරීම ගම්පොළ යුගයේ ශිලා ලේඛනවල සහ සාහිත්‍ය මූලාශවල ද දක්නට ලැබේ. මෙම යුගයේ විහාරස්ථානවල දේව රූප සමග ම බෝධිසත්ව රූප ද කරවා ඇත. ජාතක පොතේ ඇති කථා ගම්පොළ යුගයේ විහාරවල සිතුවම් කරන ලදී.[8] ගඩලාදෙණි ලිපියේ නාථ සහ මෛත්‍රී දෙදෙනා ගැන දැක්වේ. නාථ යනු මෙම දෙවියන්ගේ දකුණු ඉන්දියානු නාමය බවට මහාචාර්ය මංගල ඉලංගසිංහ විසින් පෙන්වා දෙනු ලැබේ.[9] මෙම බෝධිසත්වවරුන් පොදුවේ දෙවියන් අතර දක්වා ඇතත් බෝධිසත්වවරුන් ලෙස ඔවුන්ට හිමි වූ ස්ථානය මෙම අවධියේ වෙනත් මූලාශ්‍රවල ද දැකගත හැකිය. ලංකාතිලක සිංහල ලිපියේ මෛත්‍රී බෝධිසත්ව නමින් ද නාථ ලෝකේශ්වර නාථ නමින් ද හඳුන්වා ඇත. මින් අවබෝධ වන්නේ සෙසු දෙවියන්ට වඩා නාථ දෙවිඳුන්ට විශේෂත්වයක් මෙම යුගයේ දී හිමි වූ බවයි.

නියම්ගම්පාය ලිපියට අනුව එම විහාරයේ උඩු වියනේ මෛත්‍රී බෝසතුන්ගේ රුව සිතුවමට නැගූ බව පෙනේ. සෙංකඩගල දෙවියන් විසින් අලකේශ්වර සහ දේවමන්ත්‍රීශ්වර දෙදෙනාට සිහිනෙන් පෙනී සිට සතුරන් පරාජය කිරීම පිණිස ජය කාරණා දක්වන ලද බවට සගම ලිපිය සාක්ෂි දරයි.[10] නාථ බෝධිසත්වයකුට වඩා ලංකාරක්ෂක දෙවියකු ලෙස ක්‍රියාත්මක වූ බව පෙනේ. නාථ දෙවියන් සම්බන්ධයෙන් ආචාර්ය ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් දක්වන අදහස ඉතා වැදගත් වේ. "නාථ සහ මෙරට රාජත්වය අතර සුවිශේෂී සබඳතාවන් පැවති බවත් මෙරට පාලකයන් බෝධිසත්ව යානය අනුගමනය කළ බවත්, ඒ අනුව බෝධිසත්ව, දේව, රජ යන සංකල්පයක් පැවති බවත්, ඒ නිසා නාථ සිංහල රාජ්‍යයේ ආරක්ෂකයා[11] බවත් පවසයි. එසේ ම අම්පිටිය ලිපියේ[12] දැක්වෙන "සෙංකඩගල දෙවියන්" යනු ද මෙම නාථ දෙවියන්ම බව ඔහුගේ අදහසයි. මේ වනවිට නාථ කෘත්‍යමය වශයෙන් දෙවියකු බවට පත් වී සිටි බව ද, සත්වයන් සසරින් එතර කිරීමේ බෝධිසත්ව ගුණය වෙනුවට බැතිමතුන් ආරක්ෂා කරන ලෞකික කාර්යයන් ඉටු කළ දෙවියකු බවට පත් වූ බව ද හෝල්ට් වැඩිදුරටත් පෙන්වා දේ.

**තිරස සංදේශයේ**[13] ද නාථ දෙවියන් "නතිඳු" නමින් ද එතුමන්ගේ දේවිය තාරා බිසව නමින් ද හඳුන්වයි. එහි දී දොරවක තිබූ නාථ දේවාලයත් නාථ දෙවිඳුන් හා තාරා බිසවත් නමදින ලෙස තිසරාට විධාන කර තිබේ. ආචාර්ය ජෝන් හෝල්ට් පවසන්නේ බුදුමැඳුර තුළ නාථ දේව ප්‍රතිමාවක් පැවති බවකි.[14] මෙසේ නාථ බෝධිසත්වරයකු ලෙස සලකන නිසා එසේ තබන්නට ඇත. බුදු බව ප්‍රාර්ථනා කිරීම ද මෙකල බහුල ව සිදු වූ බව ඉහත තොරතුරු මගින් අනාවරණය වේ. ඊට අමතර ව මහායාන සංකල්පය කෙරෙහි විශේෂ නැඹුරුවක් පැවති බව පෙනේ. **සද්ධර්මලංකාරයේ** "බාහිර සිදාසියේ දී ව්‍යාඝ්‍ර ජාතක කාව ඇත.[15] මෙම කථා හුදෙක් ස්වර්ණ ප්‍රභාස, අවදාන කල්පලතා වැනි මහායාන ග්‍රන්ථවල ආර්යශූරපාදයන්ගේ ජාතක මාලාවේ ද දක්නට ලැබේ.[16] **සද්ධර්මලංකාරය** කෝට්ටේ යුගයේ දී රචනා කළත් එමගින් නිරූපණය වන්නේ ගම්පොළ යුගයේ පැවති තත්ත්වය බවට මහාචාර්ය චන්දන අබයරත්න පෙන්වා දේ. කෙසේ නමුත් ඉහත තොරතුරු තුළින් පැහැදිලි වන්නේ ගම්පොළ යුගයේ පැවතියේ ථෙරවාදී ආගමික පසුබිමක් නොව මහායාන හා හින්දු දේව විශ්වාස සම්මිශ්‍රණය වූ ආගමික පසුබිමක් බවයි.

ගම්පොළ යුගයේ දී නාථ දේව වන්දනය ජනප්‍රිය වී වැදගත්කමින් වැඩිවන අයුරු පෙනේ. එසේ වීමට කුමන හේතු ඉවහල් වූවා ද යන්න පිරික්සිය යුතුය. දිගුකාලීන වශයෙන් දේශපාලන ක්ෂේත්‍රයේ ස්ථාවරත්වයක් නොමැති වූ විට සිදුවන විපරිවර්තනයන අතිමහත් ය. ගම්පොළ යුගයේ දී මෙම තත්ත්වය වඩාත් හොඳින් නිරූපණය වන අතර ඇතැම් විට විදේශීය රාජ්‍යයන් සමග ද සබඳතා වැඩිකර ගැනීමට උත්සහ ගනී. විශේෂයෙන් ම ධර්මකීර්ති මාහිමියන් සහ සේනා ලංකාධිකාරයන් දකුණු ඉන්දියාවේ ආගමික කටයුතුවල නිරත වීමත්, ඒ සම්බන්ධතා මත දකුණු ඉන්දියානු ශිල්පීන් මෙරට විහාර කර්මාන්ත සඳහා ගෙන්වා ගැනීමත්, මේ සම්බන්ධතාවලට ප්‍රකට නිදසුන්ය. දේව විශ්වාසය හා හින්දු ආගමික බලපෑම් මෙරට සංස්කෘතියට සහ බුදුදහමට තර්ජනාත්මක තත්ත්වයකට පත් නොවී, සහජීවන තත්ත්වය නිතර පැවති බවත් ආගමික සම්මිශ්‍රණයක් ඇති කිරීමට දායක වූ බවත් පෙනේ. පොළොන්නරුවේ බලයට පත් පළමුවන විජයබාහුගේ

සිට දකුණු ඉන්දියානු රජ පවුල සමඟ පැවැත් වූ සම්බන්ධතා සැලකිය හැකිය. මෙම සබඳතා මෙරට සමාජයේ බහු ආගමික සංස්කෘතියක් බිහිවීමේ ප්‍රතිඵලයක් ලෙස අවලෝකිතේශ්වර නාථ සංකල්පය බිහිවීම ද සිදුවන්නට ඇතැයි සිතිය හැකිය. ඉහත සාකච්ඡා කළ සමස්ත කරුණු ඇසුරෙන් අපට අවබෝධ වන්නේ 7 වන සියවසේ සිට 10 වන සියවස දක්වා බෞද්ධ බෝධිසත්වයකු ලෙස පූජත්වයට පත් වූ අවලෝකිතේශ්වර ගම්පොළ යුගය වන විට එම තත්ත්වයෙන් මිදී දෙවියකු ලෙස නැවත පුද පූජාවලට ලක්වන බවකි.

නාථ දේව සංකල්පයේ ඓතිහාසික විකාශය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී කෝට්ටේ යුගය ද වැදගත් වේ. නාථ දෙවිඳුන් සම්බන්ධ දැඩි භක්තිවන්තයකු වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි නාථ දෙවිඳුන් පිළිබඳ විස්තර කරන්නේ සූර්යයාට හා චන්ද්‍රයාට සමකළ හැකි ලෙසිනි. තව ද ඔහු අනාගතයේ බුදු වන බව ප්‍රකාශ කරයි. එයින් පෙනී යන්නේ ශ්‍රී රාහුල තෙරුන් අවලෝකිතේශ්වර බෝධිසත්වයන් පිළිබඳ භක්ති වන්තයකු බවය. මහනුවර යුගයට අයත් ඇම්බැක්ක වර්ණනාවේ ද නාථ දෙවියන් ගැන සඳහන් කර ඇත. මෙම කරුණු අනුව අවබෝධ වන්නේ 15 වන ශත වර්ෂය වන විට නාථ දෙවිඳුන් ඇදහීම ශ්‍රී ලංකාවේ ඉතා ප්‍රචලිත දෙයක් වූ බවය.

නාථ දෙවියන් පසුකාලීන ව සිංහල රාජත්වය හා සමීප සම්බන්ධතාවක් ඇති කර ගත් බව හෙළි වේ. විශේෂයෙන් ම මෙම පසුබිම මහනුවර යුගය වන විට ප්‍රබල වේ. සෙංකඩගල සමය වන විට නාථ ජාති ආරක්ෂක දෙවියකු වූ බව පෙනේ. සිංහල සිව්වරම් දෙවියන්ගේ කෙනෙකු බවට පත්වන නාථ පසුකාලීන ප්‍රධාන සංස්කෘතික මංගල්‍යයන්ට ද එකතු විය. මෙතෙක් අවධානය යොමු කළ කරුණු විග්‍රහ කිරීමෙන් පෙනී යන්නේ අවලොකිතේශ්වර බෝධිසත්ව සංකල්පයේ ලෞකික ගුණාංග හේතුවෙන් නාථ සංකල්පයේ විකාශනය ඇරඹෙන බවකි. පසුව නාථ දෙවියන් ලෝකෝත්තර අරමුණු කෙරෙහි නැඹුරු වීමත් එමඟින් ඔහු නැවත බෝධිසත්වයකු බවටත් පත්වේ.

මහනුවර රජධානි සමය නාථ දේව සංකල්පයේ තවත් වර්ධිත අවධියකි. හත් වන සියවසේ පමණ සිට ලක්දිව බෞද්ධයන් විසින් ගෞරවාදයට පාත්‍රකරමින් සිටි අවලෝකිතේශ්වර බෝධිසත්වයන් 14 වන සියවස වන විට "ලෝකේශ්වර නාථ" හෝ "නාථ" ගන නමින් දේවත්වයට පත්ව සිටි අයුරු අප මුලින් සාකච්ඡා කරන ලද තොරතුරුවලින් පැහැදිලි ය.[17] කෝට්ටේ යුගයෙන් පසු නැවත නාථ දෙවියන් හා රාජකීය සම්බන්ධකමක් ඇතිවන්නේ මෙම යුගයේ දී ය.

ක්‍රි. ව. 1505 දි සිදුවන පෘතුගීසී ආගමනය මෙරට ඉතිහාසයේ ගමන් මඟ වෙත ප්‍රබල බලපෑමක් කිරීමට සමත් විය.[18] විශේෂයෙන් ම දේශපාලන, ආර්ථික හා ශාස්ත්‍රීය පරිහානියත් සමඟ බුද්ධාගමේ හා භික්ෂූන් වහන්සේලාගේ ද තත්ත්වය දුර්වල වූ බව පෙනේ.[19]මෙරටට පැමිණි පෘතුගීසීන් විසින් හත් වන බුවනෙකබාහුගේ පක්ෂය ගෙන ඔහුගේ සොහොයුරන්ට එරෙහි ව සටන් කිරීමට අනුබල දෙන ලදී. ඒ නිසා බුදුසමය මෙම වකවානුවේ වේගයෙන් පිරිහිණි. බුවනෙකබාහු රජතුමා කෝට්ටේ නගරය තුළ කතෝලික පල්ලි ඉදිකිරීමට පෘතුගීසීන්ට අවසර දීමෙන් පසු බුදු දහමට උදා වූයේ අඳුරු දශාවකි. ක්‍රි.ව. 1557 ධර්මපාල රජු බෞතිස්ම ලැබීම නිසා දෙවන පැතිස් රජු දවස සිට ලැබුණු රාජානුග්‍රහය බුදු දහමට නොලැබී ගියේ ය. වසර 30 ක පමණ කාල පරිච්ඡේදයක් තුළ බුදු සසුනේ වර්ධනයට ධර්මපාල හා රාජසිංහ යන පාලකයන් දෙදෙනාගේ ම අනුග්‍රහය නොලැබීම අවාසනාවකි.[20] බුදු දහමේ චිරස්ථිතියට අවශ්‍ය රැකවරණය සීතාවක රාජධානියෙන් ලැබුණ ද බුද්ධාගම හැරදමා හින්දු ආගම වැළඳගත් පළමු වැනි රාජසිංහ රජුගේ කාලයේ දී පෘතුගීසීන් සමඟ ඇතිවූ භයානක යුද්ධ නිසාත්, රජුගේ දරුණු සැහැසිකම් නිසාත් බුද්ධාගමට බරපතල හානි සිදු විය.[21]

ඉහත වාතාවරණය වෙනස් කර බුදුසමයට හිමි තැන ලැබුණේ පළමුවන විමලධර්මසූරිය ( ක්‍රි. ව. 1592- 1604) බලයට පත්වූ පසුවයි.[22] බෞද්ධාගමේ අභිවෘද්ධිය ඇති කිරීම සඳහා හෙතෙම පියවර කිහිපයක් ම ගත්තේ ය. රාජ්‍යයේ උරුමය වශයෙන් පිළිගැනුණු දළදා වහන්සේ දෙල්ගමු විහාරයෙන්

සෙංකඩගලට වැඩම කර රජ මැදුර ආසන්නයේ දළදා මැඳුරක් ඉදි කොට නිරන්තර පූජා පැවැත්වීය.[23] ක්‍රි.ව. 1597 වන විට උපසම්පදාවට අවශ්‍ය භික්ෂූන් වහන්සේ රංක්බංග දේශයෙන් වැඩම කර, ගැටඹේතොටේ දී උපසම්පදා කර්මය පැවැත්වීය.[24] මේ අනුව පරිහානියට පත්වෙමින් පැවති බුද්ධ ශාසනය යළි නගා සිටුවීමට හැකි වූ බව පෙනේ. එය නැවත පිරිහී පුනර්ජීවනය වන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ අවධියේ දී ය.

කන්ද උඩරට නව රාජ්‍ය පෙළපත ආරම්භ කිරීමට පුරෝගාමී වූ පළමු වන විමලධර්මසූරිය රජුගේ සිට සිංහල රාජ්‍ය වංශය අවසාන වන තෙක් එනම් ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ පාලන සමය අවසානය දක්වා නාථ වන්දනය පසුබෑමට ලක්ව තිබූ බව පෙනේ. නමුත් දෙ වන රාජසිංහ රජු ද නායක්කාර් රජවරු සමඟ පැවති සමීප සම්බන්ධතාවයන් නිසා දේව වන්-දනය ද නව නවත් ව්‍යාප්ත වන අතර නාථ වන්දනයෙහි ද යම් යම් වර්ධනයන් ඇති වේ. ගම්පොළ යුගයේ සිට සෙංකඩගල ප්‍රසිද්ධ ව සිටි නාථ දෙවියන් කෙරේ කෙබඳු ආකල්පයක් දැරු-වේ ද යන්නට සාධක නැත.[25] පළමුවන විමලධර්මසූරිය රජුගේ චිත්‍රයක් ආනන්ද කුමාරස්වාමිගේ මධ්‍යකාලීන සිංහල කලා නම් ග්‍රන්ථයේ XXIII වන චිත්‍රයේ දැක්වේ. එම චිත්‍රයට අනුව රජුගේ කිරුළෙහි අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ ආරක්ෂකයා වශයෙන් පෙනී සිටින්නේ, අමිතාභ බුදුරජාණන් වහන්සේගේ වරයෙන් නිසා රජු ද එය අනුකරණය කරමින් තමාගේ ඔටුන්න මත අමිතාභ බුදුන්ගේ රූපය යොදන්නට ඇතැයි ආචාර්ය ජෝ-ර්ජ් හෝල්ට් පෙන්වා දෙයි. ඔහු අතේ නෙළුම් මලක් ද වේ. මේ සංකේත භාවිතය අනුව රජතුමා පැරණි අවලෝකිතේශ්වර සංකල්පය යළි පණ ගන්වමින් බෝධිසත්ව දේව රාජයකු ලෙස පෙනී සිටියේ යැයි අනුමත කළ හැකි බවට තවදුරටක් හෙතෙම පවසයි.[26] මේ බුදුරුව පිළිබඳ කරුණු දක්වන නන්දන චුට්වොංග් පෙන්වාදීමට උත්සාහ කරන්නේ ඇතැම් උඩරට සිංහල රජවරුන් සිය දෙවියන් වන නාථගේ නරලොව අවතාර වශයෙන් පෙනී සිටීමට උත්සාහ ගත් බවයි.[27] එහෙත් විමලධර්මසූරිය රජු පිළිබඳ ව එවැනි සිදුවීමක් ඉතිහාසයේ දක්නට නොමැත. නාථ දෙවිඳුන් උදෙසා නාථ දේවාලයක් දළදා මාළිගාව අභියස ඉදි කිරීමෙන් එම

දෙවියන්ට හිමිවූ වැදගත්කම අවබෝධ වේ. සමකාලීන උඩරට ජනශ්‍රැතිවල නාථ දෙවියන් ශ්‍රී ලංකාවට රැකවරණය ලබාදෙන සතරවරම් දෙවියකු වශයෙන් හඳුන්වා ඇත. මීළඟට බුදු වන මෛත්‍රීය බුදුන් නාථ දෙවිඳු යැයි ද අදහසික් පවතී. මේ අනුව මහනුවර යුගයේ දී නාථ දෙවියන් සිංහල දේව මණ්ඩලයට අයත් දෙවියකු වූ බව පෙනී යයි.

ඈත අතීතයේ සිට ම මෙරට පාලකයන් විටින් විට විදේශීය රාජ වංශ සමඟ විවාහ සබඳතා පවත්වා ඇති බව පෙනේ. විශේෂයෙන් ම වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුට රාජ්‍යත්වය පවත්වාගෙන යාමට නොහැකි වූයේ ඔවුන්නට හිමිකම් කීමට දරුවෙකු නොවීමයි. එහි අවසන් ප්‍රතිඵලය වූයේ මහනුවර රාජධානියේ අවසන් භාගයේ දී විදේශීය රාජ්‍ය වංශයට මෙරට සිහසුන පිළිබඳ උරුමකම් කීමට හැකි වීමයි. ශ්‍රී විජය රාජසිංහ රජුගේ කාලයේ දී නැවත වරක් නාථ දෙවියන් පිළිබඳ පැවති චාරිත්‍ර වාරිත්‍ර නැඟී ඒමට පටන් ගත් බව කිව හැකිය. ඊට ප්‍රධාන වශයෙන් බලපෑවේ මෙම යුගයේ ප්‍රචලිත වූ හින්දු බලපෑමයි. නාථ දෙවියන් ශාන්තිකර්මවල දී මෙන්ම අසනීපවල දී පිහිටවන දෙවියකු වශයෙන් මහනුවර යුගයේ දී ප්‍රචලිත විය. මෙම යුගයේ ඇති වූ ප්‍රධාන ගැටුමක් වන්නේ නාථ හා පිටියේ දෙවියන් අතර ය. මෙම සටනින් පිටියේ දෙවියන්ට ජය අත් වූවත් නාථ සමාන්‍ය දේව මණ්ඩලයට වඩා උසස් තත්ත්වයකට පත්වූ බව පෙනේ. නායක්කර් පාලන සමයේ දී නාථ වන්දනය ප්‍රාදේශීය වශයෙන් ගැමි ජනතාව අතර ප්‍රචලිත වූ බවට පස්ගම, වෑගිරිය, හුනාපහුර හා දොඩම්වල නාථ දේවාලවලින් තහවුරු වේ. මහනුවර යුගය අවසන් වන විට අවලෝකිතේශ්වර නාථ දේවමණ්ඩලයේ කෙනෙකු වශයෙන් ද පසුව අනාගතයේ බුදු වන බෝධිසත්වයන් වශයෙන් ද ජනතාවගේ ලෞකික දිවියට උපකාර වන රෝග නිවාරකයකු වශයෙන් ද ඇදහීමට පටන්ගත් නිසා නාථ දෙවියන් වන්දනාමාන කිරීම අද දක්වා සිදු වන බව පෙනේ.[28]

සගම හා අම්පිටිය සෙල්ලිපි මඟින් පෙන්නුම් කෙරෙන්නේ සෙංකඩගල නාථ දෙවියන් හා සිංහල රාජත්වය අතර සබඳතාවක් 14 වන සියවස වන විට ගොඩනැඟී පැවති

බවය. මහනුවර අවධියෙහි පැවති අභිෂේක චාරිත්‍රවල දී විෂ්ණු හා නාථ දේවාල සඳහා ප්‍රධාන තැන හිමිවූ බව ප්‍රකට කරුණකි. එනමුත් අප මෙහි දී විශේෂ අවධානයට ලක්වන්නේ නාථ දෙවියන් සම්බන්ධයෙනි. නායක්කර් වංශිකයන් බලයට පත්වීමෙන් අනතුරුව සෘජු වශයෙන් නාථ දෙවිඳුන් හා සමාජය අතර සමීප බවක් ඇති වේ.

මහනුවර අවධිය වන විට රාජපදප්‍රාප්ත වීම හා සම්බන්ධ වැදගත් චාරිත්‍ර ගණනාවක් පැවතිණ. ඒ තුළ වඩා සුවිශේෂ වූයේ රජුට නමක් තේරීම හා මඟුල් කඩුව තේරීමේ චාරිත්‍රයයි. මෙම වැදගත් චාරිත්‍රය නාථ දේවාලය හා දේවාල භූමියේ බටහිර දෙසින් ගොඩනංවන ලද චෛත්‍යය අසළ ඉදිකරන ලද දර්ශනීය කවාකාර මණ්ඩපය තුළ සිදු කළ බව පෙනේ. රජුට සුදුසු නමක් තෝරා ගැනීමේ මංගල උත්සවය පැවැත්වූයේ මේ නාථ දේවාලයේ දී ය.[29] රාජකීය නක්ෂත්‍රාචාර්යවරුන් විසින් ලබාදුන් නම් කිහිපයක් තෝරා රන් පත්වල ලියා රිදී තැටියක තබා නාථ දේව ප්‍රතිමාව ඉදිරිපිට තබනු ලැබේ. අභිනවයෙන් රජකමට පත්වූ රජු නියමිත සුබ දිනයේ දී සේනාව සමඟ විෂ්ණු දේවාලයට ගොස් දෙවියන් පුදා නාථ දේවාලයට පැමිණ දේව පූජා පවත්වා ඇත. නාථ දෙවියන් ඉදිරියේ තැබූ රන්පත් පරීක්ෂා කොට තමන්ට අභිමත නාමයක් තෝරාගෙන පළමු ව ප්‍රධාන අදිකාරම්වරයාට කියන්නේ ය.[30] පසුව ඔහු සැමට ඇසෙන පරිදි "රජතුමන් සඳහා දෙවියන් තෝරා ගෙන ඇති නම මෙයයි." යනුවෙන් ප්‍රකාශ කරයි.[31] අනතුරුව එකී නාමයට සහිත රන්පත රජුගේ නළලේ බැඳීමෙන් පසුව රන් අසිපත ලබාගැනීමේ චාරිත්‍රය සිදු කෙරේ. දේවාලයේ ප්‍රධාන කපුමහතා විසින් සකසා ගෙනෙන සඳුන් කල්කය මත අත තවරා රජතුමා අසිපත අල්ලනු ලැබේ. මේ චාරිත්‍රය විෂ්ණු දේවාලයේ දී මෙන්ම නාථ දේවාලයේ දී සිදු කරන්නේ ය.[32]මහනුවර යුගයේ පැරණි සම්ප්‍රදායන් පිළිපදින බැවිනුත්, ලංකාවේ සැම රජ කෙනෙක් ම බෝධිසත්ව කෙනෙක් ය යන්න දහ වෙනි සියවසේ අභයගිරි වාසී භික්ෂූන් විශ්වාස කළ බැවිනුත්, පසු කාලයේ ලංකාවේ රජවරුන්ට බෝධිසත්වාකාර යන උපපද නාමය යෙදූ බැවිනුත්, රජ්ජුරුවන් සිය රාජ නාමය හා මඟුල් කඩුව අවලෝකිතේශ්වර බෝධිසත්වයන් අතින් තැබීම ද පුරාණ සිරිතක් වූවා විය හැකිය.

මහනුවර රාජධානි සමයේ සිට නැවත නාථ දෙවියන්ගේ වැදගත්කම ගොඩනැගෙන බව පෙනේ. මේ සඳහා අවශ්‍ය ප්‍රවේශය ගොඩ නැගෙන්නේ නාථ දෙවියන් සහ පිටියේ දෙවියන් අතර ගැටීම තුළිනි.[33] උඩරට ප්‍රදේශයේ බලය පිහිටුවාගෙන සිටි නාථ දෙවියන් පිටියේ දෙවියන්ගේ බලය හමුවේ යුද්ධයෙන් පැරදී පස්ගම දක්වා පසු බැස තිබේ. එසේ පසුබැම සිදු කර ඇත්තේ ද සතුන්ට වන හානිය දැක එය වලකාලීම සඳහා ය. මෙම ගැටුම පිළිබඳ ව ආචාරය හෝල්ට්ගේ විග්‍රහය ඉතා වැදගත් වේ. මෙම ගැටුම මඟින් සමකාලීන සමාජමය හා දේශපාලන සිද්ධීන් සංකේතවත් කරන බව පවසයි. දඹදෙනි, ගම්පොළ හා කෝට්ටේ යන අවධීන්හි සිංහල සමාජයේ දේශපාලන කටයුතු කෙරේ දැඩි ලෙස බල පෑ නාථ දෙවිඳුන් ක්‍රමයෙන් බෝධිසත්ව භාවයට පත්වීමත් සමඟ ඔහුගේ ලෞකික කාර්යයන් ක්‍රමයෙන් අඩු වේ. තවද බාහිර දෙවි කෙනෙකු ලෙස පිටියේ දෙවියන් උඩරට ප්‍රදේශයේ බලය පිහිටවා ගැනීම සංකේතවත් කරන්නේ නරේන්ද්‍රසිංහ රජුගෙන් අවසන් වන සිංහල රජ පෙළපතට පසු නායක්කාර්වරුන්ගේ බලය ස්ථාපිත වීම සංකේතවත් කරන බවකි. තවද උඩරට පාලකයන් රාජ්‍යත්වයට පත්වීමට පෙර නමක් තෝරාගැනීමේ දී හා ඔටුනු පැළඳීම සිදු කර ඇත්තේ මහනුවර නාථ දේවාලය ඉදිරිපිට ය. විදේශීය රජ පෙළපතක් පාලනය කළත් බෝසත් බවින් යුතු නාථ දෙවිඳුන් කෙරෙහි විශාල බලයක් පැවති බව පෙනේ. එම බලය තුළින් සංකේතවත් වන්නට ඇත්තේ සිංහල බෞද්ධ පසුබිම විය හැකිය. නමුත් වර්තමානය තුළ දේශපාලනය හා නාථ දෙවියන් අතර ඉතා සමීප සම්බන්ධතාවක් පවතින ආකාරයක් දක්නට නැති බව පෙනේ. තම දේශපාලන අරමුණු සපුරා ගැනීම පිණිස කතරගම, මුන්නේස්වරම් හෝ දකුණු ඉන්දියානු කෝවිල් වෙත දේශපාලන නායකත්වය ඒකරාශී වුවත් නාථ දෙවියන්ගේ ආශිර්වාදය සලසා ගැනීමට නො එන තරම් ය. ඉහත සාකච්ඡා කළ කරුණු තුළ දේශපාලනයේ තීරණාත්මක සාධකයක් වූයේ නාථ දෙවියන් බව පැහැදිලි වේ.

අප මෙතෙක් අවධානයට ලක් කළ කරුණු මඟින් අනාවරණය වන්නේ අවලෝකිතේශ්වර වන්දනය ස්ථාපිත වූ 8 වන සියවසේ පමණ සිට දේශපාලනය හා සම්බන්ධ වන බවක්

දක්නට ඇති ආකාරයකි. අවලෝකිතේශ්වර 14 වන සියවසෙන් පසු නාථ දෙවියන් බවට පත් වී ඇති අයුරු සංදේශ සිහිත්‍ය මගින් සනාථ වේ. නාථ දෙවියන්ගේ ස්වභාවය විවිධ විය. මිනිස් හදවත් තුළ සිටි නාථ දෙවියන් මහනුවර යුගය වන විට වඩාත් ජනප්‍රිය විය. එනිසා ම උඩරට රාජත්වය හා සමඟ සමීප තත්ත්වයක් පැවති බව සනාථ වේ. පාලකයා ක්‍රියාත්මක කළ බොහෝ තීන්දු තීරණ නාථ දෙවියන් කේන්ද්‍රගතව ක්‍රියාත්මක කර ඇත.

## ආන්තික සටහන්

1 ධර්මදාස,කේ.එන්.ඕ. සහ තුන්දෙණිය, එච්.එම්.එච්, සිංහල දේව පුරාණය, පිටු. 76.
2 පරණවිතාන, සෙනරත් "ලක්දිව මහායානවාදය," පුරාණ යුගය, පිටු. 189.
3 හේරත්, යමුනා, ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා හා රූකම්, පිටු. 204.
4 හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, මකුට මුනිධාරි අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය, පිටු. 137.
5 චන්ද්‍රසිරි, නියනගේ, ලක්දිව අභිෂේක මංගල්‍යය, පිටු. 164.
6 පූජාවලිය, සංස්. කිරිඇල්ලේ ඥාණවිමල, ගුණසේන සහ සමාගම, කොළඹ. 1986, පිටු. 698.
7 මහාවංසය, පරි. 87, ගාථා 3 -9.
8 *E.Z.* Vol. IV P. 90 -110.
9 ඉලංගසිංහ, මංගල, මධ්‍යකාලීන ලංකාවේ ආගම, පිටු. 270-280.
10 *E.Z.* Vol. IV P. 296 -311.
11 හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය, පිටු. 153.
12 *E.Z.* Vol. IV, P. 271 -273.
13 තිසර සංදේශය, කවි, 130 - 131.
14 හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය, පිටු. 152.
15 සද්ධර්මාලංකාරය, සංස්. කළුතර සෝමානන්ද, රත්නාලංකාර ප්‍රකාශකයෝ, කොළඹ, 1953, පිටු.795, ගාථා, 16.
16
17 ධර්මදාස, කේ.එන්.ඕ. "ලක්දිව බුදුසමයෙහි බෝධසත්ව සහ දේව සංකල්පය" සංස්කෘතික ලිපි සංග්‍රහය, සංස්. නිශ්ශංක පෙරේරා සහ

උදේනි පද්මනාද, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, සමයවර්ධන, කොළඹ, 1995, පිටු. 94.

18 අමරසිංහ, සිරිමෙවන්, සීතාවක රාජධානියේ උන්නතිය ද අවනතිය ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක්, ඕල්කට් අනුස්මරණ පදනම, මහරගම, 1998, පිටු. 95.

19 අබේසිංහ, ටිකිරි, පරංගි කෝට්ටේ, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්, කොළඹ, 1968, පිටු. 95.

20 බෞද්ධ තොරතුරු පරීක්ෂණ සභා වාර්තාව, පිටු. 33- 34.

21 අබේසිංහ, ටිකිරි, පරංගි කෝට්ටේ, පිටු. 190

22 දේවරාජ, ලෝනා, ශ්‍රීමති, උඩරට රාජධානිය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පාදුක්ක, 1997, පිටු. 108-135.

23 අධිකාරි, අභයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන හා මහ සඟන, ශ්‍රී ධර ප්‍රකාශන, රාජගිරිය, 1991. පිටු. 26.

24 මහාවංසය, පරි. 94, ගාථා, 194.

25 ධර්මදාස, කේ.එන්.ඕ, හා තුන්දේණිය එච්.එම්. එස්. සිංහල දේව පුරාණය, පිටු. 87.

26 හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, මකුට මුනිධාරි අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය, පිටු. 118.

27 Chatiwongs, Nandana, ***The Iconography of Avalokiteshavara in Mainland of South East Asia***, Thailand, 1942, P.83.

28 හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, මකුට මුනිධාරි අවලෝකිකේශ්වර නාථ ලංකා පුරාණය, පිටු. 189.

29 ධර්මදාස. කේ.එන්. ඕ. "ලක්දිව බුදුසමයෙහි බෝධිසත්ව සහ දේව සංකල්පය", සංස්කෘත ලිපි සංග්‍රහය, නිශ්ශංක පෙරේරා සහ තවත් අය, පිටු. 95.

30 ධර්මදාස, කේ.එන්.ඕ, හා තුන්දේණිය එච්.එම්. එස්. සිංහල දේව පුරාණය, පිටු. 79.

31 පරණවිතාන, සෙනරත්, "ලක්දිව මහායානවාදය, පුරාණ යුගය, පිටු. 193.

32 Davy, John, ***An Account of the Interior of Ceylon and Inhabitomts***, London, 1821.p. 64.

33 නාථ දෙවියන් සහ පිටියේ දෙවියන් අතර ගැටීම මෙම පරිච්ඡේදයේ පිටු 94-97 යටතේ බලන්න.